# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1539 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | திகதி<br>දිනය<br>Date | 08/12/2023<br>පැය 1015 |

**මාධ්‍ය නිවේදනය**

**හැටන් කොළඹ ප්‍රධාන මාර්ගයේ අවහිරතාවයක් - ගිනිගත්හේන පොලිස් වසම.**

2023.12.07 වන දින සවස් කාලයේ හැටන් කොළඹ ප්‍රධාන මාර්ගයේ ගිනිගත්හේන සහ වටවල පොලිස් වසම් අතර දියගල ප්‍රදේශයේ 56/2 බෝක්කුව ආසන්නයේ නායයාමක් හේතුවෙන් මාර්ග අවහිරතාවයක් සිදුව ගමනාගමනය අවහිර වී ඇත.

එම අවහිරතාවය ඉවත් කර ගමනාගමනය යථා තත්වයට පත්කරන තුරු පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස එම මාර්ගය භාවිතා කිරීමට අපේක්ෂා කරන මහජනතාවගෙන් සහ රියදුරන්ගෙන් පොලිසිය ඉල්ලා සිටී.

- හැටන් දෙස සිට කොළඹ සහ මහනුවර දෙසට ධාවනය වන වාහන දියගල හංදියෙන් නොටන්බ්‍රිජ් නගරය හරහා ගිනිගත්හේන, රංජුරාව හංදියට සහ කළුගල හංදිය දක්වාද,
- කොළඹ දෙස සිට ධාවනය වන වාහන කළුගල හංදියෙන් නෝටන්බ්‍රිජ් හරහා දියගල හංදියෙන් හැටන් දක්වාද,
- මහනුවර දෙස සිට ධාවනය වන වාහන ගිනිගත්හේන, රංජුරාව හංදියෙන් නෝටන්බ්‍රිජ් හරහා දියගල හංදියෙන් හැටන් දෙසටද ධාවනය කරවීමට පියවර ගෙන ඇත.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.